00070

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන- හයවන මට්ටම 201
අවසාන පරීක්ෂණය - 2019
අධ්‍යාපන කළමනාකරණය - ESU4115/STU6315
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2019.02.12 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. සුදුසු නිර්වචනයක් ඇසුරින් කළමනාකරණ සංකල්පය පැහැදිලි කරන්න.

02. "පාසල විධිමත් සංවිධානයකි." කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ සංවිධාන ව්‍යුහය ඇඳ දක්වන්න.

04. අධ්‍යාපන කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ සංවර්ධන වගකීම් මොනවා ද?

05. ඵලදායී විදුහල්පතිවරයකුගෙන් අපේක්ෂා කරනු ලබන නායකත්ව ගුණාංග පහක් (05) සඳහන් කරන්න.

06. ගුරුවරයාගේ වෘත්තීය සංවර්ධනය පාසල් මට්ටමේ අධීක්ෂණ ක්‍රියාවලියේ එක් මූලික අරමුණකි. කෙටියෙන් පැහැදිලි කරන්න.

07. විදුහල්පතිවරයකුට මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය වන්නේ ඇයි දැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.

08. මාස්ලෝගේ අවශ්‍යතා න්‍යායට අනුව මානව අවශ්‍යතා ධූරාවලිය සඳහන් කරන්න.

(ලකුණු 05 x 8 = 40)

8

0007

## 2 වන කොටස

09. (i) කළමනාකරණ ක්‍රියාවලියේ මූලික සංරචක සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඉන් එක් සංරචකයක් තෝරාගෙන, නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) තෝරාගත් සංරචකයට අදාළව ඔබේ පාසලේ පවතින එක් **(01)** ගැටලුවක් හඳුනා ගෙන, එම ගැටලුව විසඳීම සඳහා ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

10. (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ පවතින ගැටලු හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඉන් එක් ගැටලුවක් තෝරාගෙන එය පාසලේ කළමනාකරණ ක්‍රියාවලියට බලපාන ආකාරය විමර්ශනය කරන්න. (ලකුණු 08)

(iii) හඳුනාගත් ගැටලුව විසඳීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා මොනවා ද? (ලකුණු 08)

11. (i) "පන්ති කළමනාකරණය" යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) යහපත් පන්ති කළමනාකරණයක් සඳහා ගුරුවරයකුට භාවිතා කළහැකි පන්ති කළමනාකරණ උපාය මාර්ග/ශිල්පීය ක්‍රම හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 08)

(iii) නිවැරදි පන්ති කළමනාකරණයක් තුළින් ගුරුවරයකුට ලබා ගත හැකි ප්‍රතිලාභ දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) "විද්‍යාත්මක කළමනාකරණය" යන්නෙන් ඔබට අර්ථවත් වන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) විද්‍යාත්මක කළමනාකරණයේ මූලධර්ම සඳහන් කරන්න. (ලකුණු 06)

(iii) පාසලක කළමනාකරණ ක්‍රියාවලිය සඳහා විද්‍යාත්මක කළමනාකරණයේ අදාළත්වය විමර්ශනය කරන්න. (ලකුණු 10)

13. (i) විදුහල්පතිවරයකුට අධ්‍යාපන කළමනාකරණ පුහුණුවේ ඇති අවශ්‍යතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) අධ්‍යාපන කළමනාකරණ පුහුණුවක දී සලකා බැලිය යුතු වැදගත් අංශ මොනවාද? (ලකුණු 06)

(iii) අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම තුළින් අධ්‍යාපන පද්ධතියට ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් **(02)** උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

14. (i) "නායකත්වය" යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) නායකත්වය සම්බන්ධ ප්‍රධාන න්‍යායයන් දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඉන් එක් න්‍යායයක් තෝරාගෙන, එය ඔබේ පාසලේ නායකත්වයට අදාළව විග්‍රහ කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.